**ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

-----------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

----------------------

ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 28 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.18 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්

රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගතකර දක්වා ඇති විගණිත නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබූ බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | | **ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම. | 2.1.1 (ආ) |
| | | 2. | ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.1.2(අ) |
| | | 3. | මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.1.2.(ආ) |
| | | 4. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.2 (අ),(ආ) (ඇ) (ඈ) |
| 128(1)(ආ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. | තත්කාර්ය අතුරු අග්‍රීමය පියවීමේ ප්‍රමාදය | 2.12 |
| | | 2. | පොදු තැන්පත් ගිණුමේ අඩුපාඩු | 2.13 |
| | | 3. | ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම | 2.14 |
| | | 4. | අනුකූල නොවීම් | 2.15 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.11 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා | 1. | වත්කම් ලේඛනගත කිරීම. | 2.3 (අ) |
| | | 2. | වත්කම්වල ආරක්ෂාව | 2.3 (ආ) |

| | | | | |
|---|---|---|---|---|
| | වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | | තහවුරු නොකිරීම. | |
| | | 3. | වාහනවල අයිතිය පවරා නොගැනීම. | 2.3 (ඇ) |
| | | 4. | රජයේ වත්කම් අවභාවිතය | 2.3(ඉ) |
| | | 5. | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් | 2.3(ඊ) |
| | | 6. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමේ අඩුපාඩු | 2.3(උ) |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | 1. | බැඳීම් හා බැරකම් | 2.4 |
| | | 2. | අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම. | 2.10(අ)<br>2.3.(ආ)I |
| | | 3. | වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාදවී ඉදිරිපත් කිරිම. | 2.1.3 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.11(අ) |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. | අවිධිමත් ගනුදෙනු | 2.5 |
| | | 2. | කළමනාකරණ දුර්වලතා | 2.9 |
| | | 3. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සපයා ඇති ප්‍රතිපාදන උපයෝජනයේ දී සිදු වී ඇති ඌනතා | 2.10(ආ) (II) |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් | | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.10(ආ) |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව | | |
| 128(1)(ග) | ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තබන බව | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු | 2.17 |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | 1. මූල්‍ය අක්‍රමිකතා ස්වභාවයේ ගනුදෙනු | 2.6 |
| | | 2. හානි පිළිබඳ වගකීම | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------------

### 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්

----------------------------------------------------------

(අ) ප්‍රාදේශීය පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කරමින් දිස්ත්‍රික් පරිපාලන කටයුතු මෙහෙය වීම.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් මනා වූ මූල්‍ය කළමනාකරණයක් පවත්වාගෙන යාම.

(ඇ) ප්‍රාදේශීය මට්ටමින් සිදු කෙරෙන සියලුම ක්‍රමසම්පාදන කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒවායෙහි ප්‍රගති පාලන කටයුතු සිදුකිරීම.

(ඈ) දිස්ත්‍රික් පරිපාලන කටයුතුවලට සම්බන්ධ සියලුම නිලධාරීන්ගේ මානව සම්පත් සංවර්ධන කටයුතු සිදුකිරීම.

(ඉ) දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒවායෙහි ප්‍රගති පාලන කටයුතු සිදුකිරීම.

(ඊ) දිස්ත්‍රික්කයේ පරිපාලන කටයුතු ශක්තිමත් කිරීම වෙනුවෙන් වූ ප්‍රාග්ධන ආයෝජනයන්ට අදාළ සියලුම ඉදිකිරීම් කටයුතු සැලැසුම් කිරීම හා ඒවා අධීක්ෂණය කිරීම.

(උ) දිස්ත්‍රික් කෘෂිකර්ම කටයුතු හා පාරිසරික කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒ ආශ්‍රිත ගැටළු විසඳීමට කටයුතු කිරීම.

(ඌ) දිස්ත්‍රික්කයේ අධ්‍යාත්මික සංවර්ධනය හා ජාතීන් අතර සුහදත්වය ඇති කිරීම සඳහා අවශ්‍ය කටයුතු මෙහෙයවීම.

(එ) ඉඩම් ගැටළුවලට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

(ඒ) ගිනි අවි බලපත්‍ර නිකුත් කිරීම හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු

(ඔ) දිස්ත්‍රික් තොරතුරු සම්පාදනය

(ඕ) දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංවර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළ යුතු කාර්යභාරයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරයන් පහත දැක්වේ.

| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන | ස්ථාපිත කිරීමේ අධිකාරී බලය | කාර්යභාරය |
|---|---|---|
| (i) මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | |
| (ii) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | |
| (iii) නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | |
| (iv) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | |
| (v) පල්ලෙපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | |
| (vi) රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 1992 අංක 58 දරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමේ පනත | මධ්‍යම රජය සහ පළාත් සභාවලින් පවරනු ලබන පරිපාලන හා සංවර්ධන කාර්යභාරයන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම. |
| (vii) අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | |
| (viii) ලග්ගල-පල්ලෙගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | |
| (ix) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | |
| (x) යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | |
| (xi) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | |

## 2.3 කාර්යසාධනය

### 2.3.1 සැලැසුම් කිරීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විල්ගමුව හා රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැසුම් 2017 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 2.3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ බ්‍රැන්ඩිගල උද්භිත උද්‍යානය ඉදිකිරීම වෙනුවෙන් ලද සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනයට නොගෙන ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3.65 ක් වූ ගලඋඩහේන මාණික්කාවත්ත මාර්ගයේ පාලම ඉතිරි කොටස ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා 2017 වර්ෂයේදී තීරණය කර තිබුණ ද එය සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට එක් ව්‍යාපෘතියක් සඳහා සහ ලංකා විදුලි බල මණ්ඩලයට ව්‍යාපෘති 06 ක් සඳහා පිළිවෙලින් රු.557,980 ක් හා රු.1,283,286 ක් ලෙස එකතුව රු.1,841,266 ක මුදලක් නිදහස් කර තිබුණ ද එම ව්‍යාපෘති නිමකර නොතිබුණි.

(ii) විල්ගමුව, ගලේවෙල, යටවත්ත, අඹන්ගග කෝරළේ, ලග්ගල පල්ලේගම, රත්තොට, නාඋල, පල්ලේපොල හා උකුවෙල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් විසින් සමාලෝචිත වර්ෂයේ චෙක්පත් 87 ක් මඟින් රු.මිලියන 8.83 ක් වටිනා භාණ්ඩ මිළදී ගැනීම වෙනුවෙන් වියදම් දරා තිබුණ ද ඊට අදාළ භාණ්ඩ හා සේවා සපයා නොතිබුණි.

**2.3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජුනි 14 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 302 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 208.19 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 93.81 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදයෙන් සියයට 31 ක් ඉතිරි කර තිබුණි.

**2.4.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ප්‍රසම්පාදන සැලැසුම් කිරීම සහ ප්‍රාරම්භක අවධිය**

2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විල්ගමුව, යටවත්ත, උකුවෙල, රත්තොට, පල්ලේපොල , නාඋල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2017 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**2.4.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය අනුව ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කළ යුතු අතර එම වාර්තා ලංසු විවෘත කිරීම් කමිටුවේ සියලු සාමාජිකයින් විසින් අත්සන් කළ යුතු වුවත් විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එවැනි වාර්තාවක් නඩත්තු කර නොතිබුණි.

(ආ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් දඹුල්ල තම්මැන්නා ඇළ පුළුල් කිරීම හා ඉවුරු බැම් බැඳීම වෙනුවෙන් කර්මාන්ත 08 ක ගිවිසුම්ගත මුදල වූ රු. මිලියන 25.1 ක් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 මාර්ගෝපදේශය අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවක් පිරිනැමීමට පෙර එක් එක් අයිතමයන් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති මිල ගණන් ඇගැයීමට ලක්කර අතාත්වික අඩු අනුප්‍රමාණයන් ඉදිරිපත් කර ඇති මිල ගණන් වලට ඔවුන් එම වැඩ ඒකකය සිදුකරන්නේද යන්න තහවුරු කරගත යුතු වුවත්, දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියේ අදියර 9, 11 හා 12 ට අදාළ ඇස්තමේන්තුවල හා කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් අතර සියයට 25 ක සිට සියයට 78 ක් දක්වා මිල අනුප්‍රමාණයන්හි විචලනයන් පැවතුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10.1 මාර්ගෝපදේශය ප්‍රකාරව පශ්චාත් සුදුසුකම් පරීක්ෂාවක් සිදුකර ලංසු ඇගැයීම සිදුකළ යුතු වුවත්, රු. මිලියන 25.1 ක් වටිනා දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේදී එවැනි ඇගැයීමක් සිදුකර නොතිබුණි.

**2.5 වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරීම**

යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු රජයේ නිවාසවලට අදාළව වෙන වෙනම ලිපි ගොනු සහ විදුලි උපකරණ හා අනෙකුත් ඉන්වෙන්ට්‍රි සඳහා ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි.

**(ආ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

**---------------------------------------------**

නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩා කාමරය , තරුණ සේවා ගොඩනැගිල්ල හා මොරගහකන්ද ව්‍යාපෘති කාර්යාලයට යාබද ගරාජය තුළ අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ පවතින භාණ්ඩ මෙන්ම භාවිතා නොකරන ලද භාණ්ඩ අනාරක්ෂිතව රඳවා තිබුණි.

**(ඇ) මූල්‍ය හා මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය**

**---------------------------------------------------------------**

2010 දෙසැම්බර් 07 දිනැති අයවැය චක්‍රලේඛ අංක 150 යටතේ 2011 හා 2012 වර්ෂවල මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ රු.67,200,000 ක් වටිනා වාහන 12 ට අදාළ කල්බදු වාරික සමාලෝචිත වර්ෂයේදී ගෙවා අවසන් වී ඇතත් මෙම වාහනවල අයිතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරාගෙන නොතිබුණි.

**(ඉ) රජයේ වත්කම් අවභාවිතා කිරීම.**

**--------------------------------**

දඹුල්ල හා උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව පිළිවෙලින් අනවසර ඉඩම් කට්ටි 03 ක් හා 296 ක් ලෙස එකතුව ඉඩම් කට්ටි 299 ක් නියමානුකූල කිරීමේ හෝ නැවත පවරාගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

**(ඊ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------------------**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|---|
| (i) | ගොඩනැගිලි | 02 | රු. තක්සේරු නැත. | කරවර්ෂ 1 ත් වර්ෂ 3 ත් අතර |
| (ii) | යන්ත්‍ර සූත්‍ර | 05 | -එම- | -එම- |

**(උ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-----------------------------------------**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2018 ජුනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, 2018 ජුනි 30 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.6 බැදීම් හා බැරකම්**

**------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

------------------------------------------------------

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූලනොවී වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 257 ක ප්‍රතිපාදනය රු.මිලියන 2.2 කින් ඉක්මවා රු.මිලියන 2.5 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

**(ආ) හෙළිදරව් කර නොතිබූ බැරකම්**

**---------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක රු.735,125 ක බැරකම් හෙළිදරව් කර නොතිබුණි.

## 2.7 අවිධිමත් ගනුදෙනු

**--------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල සෙවන ගොඩනැගිලි 03 ක් ඉදිකිරීම වෙනුවෙන් සලසා තිබුණු රු.මිලියන 3.63 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3.59 ක් වැය කර ගොඩනැගිලි 02 ක් පමණක් ඉදිකර තිබුණි.

(ආ) රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අසාදු ලේඛනගත විය යුතු කොන්ත්‍රාත්කරුවෙකුට රු.මිලියන 5.84 ක් වටිනා ව්‍යාපෘති 14 ක් ප්‍රදානය කර තිබුණි.

(ඇ) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම සඳහා පෞද්ගලික ආයතන දෙකකට ඇණවුම් ලබා දී එම ඇණවුම් 02 ටම අදාළ රු.74,280 ක වටිනාකම එම එක් ආයතනයක් වෙත ගෙවා තිබුණි.

## 2.8 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

**---------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භාවිතා කරනු ලබන වාහන 02 ක් සඳහා ධාවනය කළ දුර ප්‍රමාණය අනුව ඉන්ධන අවශ්‍යතාවය ඉක්මවමින් රු. 113,662 ක් වටිනා ඉන්ධන වැඩියෙන් ලබාගෙන තිබුණි.

(ආ) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා බඩගහවත්ත පාර කුට්ටිගල් ඇල්ලූ මාර්ගය දෙපස කොන්ක්‍රීට් කිරීමේදී ඉටු නොකළ කොන්ක්‍රීට් වැඩ සඳහා රු.78,289 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බේලියකන්ද සමූහ ගොවිපළ පාර කුට්ටිගල් ඇල්ලීමේ කර්මාන්තයේ ගිවිසුම්ගත ඇස්තමේන්තු උපදෙස් පරිදි ABC මිශ්‍රණය අතුරා තලා නොතිබීමත්, මාර්ගය දෙපස කොන්ක්‍රීට් මිශ්‍රණයේ දුර්වලතාවයත්, ඒ සඳහා භාවිතා කළ හැඩයම් ලෑලි නිශ්ඵල වියදමක් වීමත් හේතුවෙන් රු.405,058 ක අධි ගෙවීමක් සිදුකර තිබුණි.

## 2.9 හානි පිළිබඳ වගකීම

----------------------

ඉකුත් වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අස්ථානගත වූ ලැප්ටොප් පරිගණකයේ රු.88,665 ක අලාභය ද යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අස්ථානගත වූ ටැප් පරිගණකයේ දෙපාර්තමේන්තු ගාස්තු ද ඇතුළත් රු. 70,000 ක අලාභය ද ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2.10 විසඳා නොතිබුණු විගණන ඡේද

--------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති යොමුව<br>වර්ෂය | <br>ඡේද අංකය | වාර්තාවියොමුගත විෂයය | නිරීක්ෂණය |
|---|---|---|---|
| 2007 | 7.5 (අ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා | ඇටවරාහේන ප්‍රජාශාලාව ඉදිකිරීමේ දුර්වලතා |
| 2008 | 7.4 (ඇ) | නීති , රීති රෙගුලාසිවලට අනුකූ නොවීම | (i). අයවැය චක්‍රලේඛ විධිවිධානවල පටහැනිව භාණ්ඩ මිලදී ගැනීම<br>(ii). ජාතිය ගොඩනැගීමේ හා වතු යටිත පහසුකම් අමාත්‍යාංශ චක්‍රලේ විධිවිධානවලට පටහැනිව වියදම් දැරීම<br>(iii). රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනි අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම. |
| 2010 | 4.10 (අ) | | විල්ගමුව බත්ගම්පල සහල් සැකසුම් මධ්‍යස්ථානය ආරම්භ නොකිරීම හා එහි වත්කම් නිෂ්ක්‍රීයව පැවතීම සහ ඒ සඳහා දරන ලද වියදම නිශ්ඵල වීම. |
| 2012 | 1.7 | | |
| 2014 | 3.5 | | |
| 2015 | 3.6 (ආ) | | |
| 2015 | 3.6 | | (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්<br>(ආ) නාඋල පේෂ කර්මාන්ත මධ්‍යස්ථානය ආරම්භ නොකිරීම<br>(ඇ) නාඋල ජල ව්‍යාපෘතියට අදාළ ජල මෝටරය බාහිර පාර්ශවයන් වෙත ලබා දී |

| | | | |
|---|---|---|---|
| | 3.12(ඇ) | | (ඇ) පරිත්‍යාග ලෙස ලද වත්කම් ගිණුම් ගත නොකිරීම. |
| | | | රිටිගල ඇළ හා ජල ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද වියදම් නිශ්ඵල වීම |
| | 3.9 (අ) (i) | ප්‍රධාන කාර්යයන්ට පටහැ ක්‍රියාකාරකම් | විල්ගමුව සංස්කෘතික මධ්‍යස්ථානය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතීම. |
| 2016 | 3.2.2 (අ), (ඊ), (උ), (ඌ), (ඒ), (ඔ), (ඕ), (ක), (ග) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ දී ඇති වූ ඌනතාවයන් | (අ) මූලධන වැය විෂයයන් 08 ක රු.මිලියන 135 ප්‍රතිපාදන ඉතිරි වී තිබීම.<br>(ඊ) හබරගහමඩ පේෂකර්ම මධ්‍යස්ථානය නිෂ්කාර්යව පැවතීම.<br>(උ) හබරගහමඩ පේෂකර්ම මධ්‍යස්ථානයට මිලදී ගත් අමුද්‍රව්‍ය හා උපකරණ නිශ්කාර්යව පැවතීම .<br>(ඌ) ඉඩම පවරාගැනීමකින් තොරව දඹුල්ල ටී. බී .තෙන්නකෝන් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම<br>(ඒ) නාඋල ලිහිණිපිටිය ජල යෝජනා ක්‍රමයේ ජල නළ එළීමේ දුර්වලතා හේතුවෙන් එම ව්‍යාපෘතිය අසාර්ථක වීම.<br>(ඔ) උකුවෙල ඇල්කඩුව නගරයේ ක්‍රීඩා පිටිය ඉදිකිරීමේ දුර්වලතා<br>(ඕ) උකුවෙල උඩංගමුව ප්‍රජාශාලාව සඳහා ඉතිරි ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් දරන ලද වියදම නිශ්ඵල වීම.<br>(ක) නාඋල ඕපල්ගල ජල යෝජනා ක්‍රමය අසාර්ථක වීම |

| | | |
|---|---|---|
| | | (ග) නාඋල මොරගහමඩ ජලයෝජනා ක්‍රමය අසාර්ථක වීම |
| 3.7 (අ) | ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම | (අ) ගලේවෙල කඳන්ගමුව පාසැල් මාවත සංවර්ධන ව්‍යාපෘතිය |
| (ආ) | ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් ව්‍යාපෘති 11ක් නිම නොකර අත්හැර දැමීම. |
| 3.8(අ) (ii) (ආ) | ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන් සැලැසුම් කිරීම. | (අ) රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ වැට ඉදිකිරීමේ දුර්වලතා<br>(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති ඉටු නොකිරීම. |
| 3.10 (අ),(ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පරිපාටියෙන් බැහැරවීම. | (අ) ලංසු කැඳවීම් සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදී නොතිබීම<br>(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් විසින් ලංසු ලියාපදිංචි තැපෑලෙන් ලබා නොගැනීම |
| 3.11 (අ) | පාඩු හා හානි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් වෙත ලබාදී තිබූ ලැප්ටොප් , පරිගණකයක් හා ටැබ් යන්ත්‍රයක් අස්ථානගත විම |
| 3.14 (අ) | කළමනාකරණ දුර්වලතා | රජයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉඩම් පවරා ගැනීම අවස්ථා 54 ක දී වර්ෂ 02 සිට වර්ෂ 35 දක්වා ප්‍රමාද වීම. |

## 2.11 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අත්සන් කර බෙදා දීමට සූදානම්කර තිබූ දීමනා පත්‍ර 12 ක් වර්ෂ 21ත් වර්ෂ 35 ත් අතර කාල පරාසයක් තුළ බෙදා නොහැර උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

(ආ) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන යෝජනා ප්‍රතිපාදන යටතේ අවස්ථා 12 කට අදාළ ව ලබාදුන් රු. 408,000 ක් වටිනා උපකරණ එකම ආයතන හා සමිති සඳහා ලබා දී තිබුණි.

(ඇ) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ක්‍රියාකාරී නොවූ සමිති 15 ක් සඳහා රු. 327,000 ක ද්‍රව්‍ය හා උපකරණ ලබා දී තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් රු.මිලියන 14.34 ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීම සඳහා ලියන ලද චෙක්පත් 126 ක් ආදායකයින් වෙත භාරනොදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අතරදවා ගෙන තිබුණි..

(ඉ) ගෙවීම් වවුචර් විගණනය වෙත ඉදිරිපත් නොකිරීම නිසා පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි එකතුව රු.659,748 කට අදාළ වූ ගනුදෙනු 03 ක් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ඊ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 09 කට සහ ඉකුත් වර්ෂයේ නිකුත් කළ විගණන විමසුම් 02 කට 2018 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 3,042.35 ක් විය.

## 2.12 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 436.83 | 435.06 | 1.77 | 0.41 |
| | මූලධන | 50.25 | 47.76 | 2.49 | 4.96 |
| | **එකතුව** | **487.08** | **482.82** | **4.26** | 0.87 |
| 2014 | පුනරාවර්තන | 429.58 | 429.48 | 0.10 | 0.02 |
| | මූලධන | 51.25 | 50.29 | 0.96 | 1.87 |
| | **එකතුව** | **480.83** | **479.77** | **1.06** | 0.22 |
| 2015 | පුනරාවර්තන | 556.15 | 552.48 | 3.67 | 0.66 |
| | මූලධන | 212.00 | 69.96 | 142.04 | 67.00 |
| | **එකතුව** | **768.15** | **622.44** | **145.71** | 18.97 |
| 2016 | පුනරාවර්තන | 584.20 | 579.23 | 4.97 | 0.85 |
| | මූලධන | 296.00 | 205.56 | 90.44 | 30.55 |
| | **එකතුව** | **880.20** | **784.79** | **95.41** | 10.83 |
| 2017 | පුනරාවර්තන | 583.69 | 577.20 | 6.49 | 1.11 |
| | මූලධන | 302.00 | 208.19 | 93.81 | 31.06 |
| | **එකතුව** | **885.69** | **785.39** | **100.30** | **11.32** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම**

**------------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ කාර්යභාරයන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු අයවැය ඇස්තමේන්තුව තාත්ත්වික ලෙස පිළියෙල කර නොතිබීම නිසා පරිපූරක ඇස්තමේන්තු මඟින් වැය විෂයයන් 02 ක් සඳහා රු.මිලියන 14.30 ක අමතර ප්‍රතිපාදන සලසා ගැනීමටත් මුදල් රෙගුලාසි 66 මඟින් වැය විෂයයන් 17 ක රු.මිලියන 33.55 ක ප්‍රතිපාදන අඩුකර වැය විෂයයන් 11 ක ප්‍රතිපාදන වැඩිකර ගැනීමටත් සිදු වී තිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට ලබාදී තිබූ ප්‍රතිපාදනයන් ඉක්මවා වැය විෂය අංක 2102 හා 2103 යටතේ රු.1,419,887 ක වත්කම් අත්පත් කරගෙන තිබුණි.

(ii). ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් වත්කම් අත්පත් කර ගැනීමේදී දරන ලද වියදම , විසර්ජන ගිණුමෙහි වැය විෂය අංක 2102 හි රු.1,081,164 ක් වැඩියෙන් ද විෂය අංක 2103 හි රු.2,285,552 ක් අඩුවෙන් ද දක්වා තිබුණි.

(iii). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක වෙන්දේසි වටිනාකම රු. 71,465 ක් වූ භාණ්ඩ අයිතම් 162 ක ඒකක 639 ක් සහ වෙන්දේසි කර තිබූ තක්සේරු වටිනාකම රු. 16,896 ක් වූ භාණ්ඩ අයිතම 26 ක් සම්බන්ධයෙන් විසර්ජන ගිණුම තුළ ගැලපීම් කර නොතිබුණි.

(iv). වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය, එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 06 ක සිට සියයට 73 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි .

(v). වෙනත් අමාත්‍යාංශ 28 ක්, දෙපාර්තමේන්තු 20 ක් හා කාර්යාල 2 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 1,893.72 ක්, රු.මිලියන 211.55 ක් හා රු.මිලියන 27.1 ක් වශයෙන් එකතුව රු. මිලියන 2,132.37 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 1,909.39 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 222.98 ක් හෙවත් සියයට 10.46 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- වැය විෂයයන් 30 කට අදාළව ලද රු.මිලියන 147.66 ක ප්‍රතිපාදනයන් අදාළ කාර්යයන් සඳහා බෙදා නොහැර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

- රත්තොට හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍යතාවය ඉක්මවමින් ප්‍රතිපාදන ලබා දීම හේතුවෙන් පිළිවෙලින් රු. මිලියන 0.5 ක් හා රු. මිලියන 1.50 ක් වශයෙන් එකතුව රු. මිලියන 2 ක ප්‍රතිපාදිත මුදල් ඉතිරිවී තිබුණි.

**2.13 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 60.00 | 59.44 | 33.00 | 33.78 | 170.00 | 155.76 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.840,567 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 17 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සුදුසු ඇපකරුවන් ඉදිරිපත් කර නොතිබූ අවස්ථා 03 කදී රු.449,530 ක් ද පොදු 158 (අ) ආකෘති පත්‍රය සම්පූර්ණ කර නොතිබූ අවස්ථා 06 කදී රු.573,630 ක් ද ලෙස එකතුව රු. 1,023,160 ක ආපදා ණය මුදල් ලබාදී තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම්කාර්යාලය විසින් පිළියෙල කර තිබූ අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු අයගෙන් අයවිය යුතු ශේෂ ලයිස්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අත්තිකාරම් ගිණුමේ එම ශේෂයන් සමඟ සැසඳීමේ දී රු.93,938 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

**2.14 අග්‍රිම ගිණුම**

2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කාර්යය නිම කර දින 10 ක් ඇතුළත ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රිමයක් නිරවුල් කළ යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් විසින් අවස්ථා 72 කදී ලබාදී තිබුණු එකතුව රු.859,020 ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම දින 12 ක සිට දින 115 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

## 2.15 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 07 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 224.67 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ඉක්ම වූ එකතුව රු. මිලියන 1.4 ක් වූ තැන්පතු 38 ක් සම්බන්ධයෙන් දඹුල්ල, ලග්ගල - පල්ලේගම හා ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් 2014/2015 මහකන්නයේ වී මිළදී ගැනීම සඳහා ලබාදී තිබුණු රු. මිලියන 2.76 ක මුදල් අදාළ කාර්යයභාරයන් ඉටු නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති 04 කට අදාළ රු. 102,247 ක් වටිනා රුඳවුම් මුදල් වර්ෂ 02 කට ආසන්න කාලයක් නිදහස් නොකර පොදු තැන්පත් ගිණුම තුළ රඳවා තබා තිබුණි.

(ඉ) තැන්පත් ගිණුමකට අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල් කල් ඉකුත්වූ තැන්පත් වශයෙන් සළකනු ලැබීම සඳහා ඉඩ නොතබා මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව සුදුසු පරිදි කටයුතු කළ යුතු වුවත් අඹන්ගඟ කෝරළේ හා උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අවස්ථා 04 කට අදාළව රු. 234,400 වූ මුදල් අරමුණු සඳහා යොදානොගෙන පොදු තැන්පත් ගිණුම තුළ රඳවාගෙන තිබුණි.

## 2.16 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ඨය | අඹන්ගඟ කෝරළේ, රත්තොට, හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | අඹන්ගඟ කොරළේ, නාඋල හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (ඇ) | තොග පොත | මුදල් රෙගුලාසි 751 හා 763 | උකුවෙල , යටවත්ත හා නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨය | යටවත්ත හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| ( ඉ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) | විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (ඊ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | උකුවෙල, නාඋල හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (උ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | යටවත්ත,විල්ගමුව හා රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (ඌ) | අත්තිකාරම් ලේඛනය | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රජාා ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය | දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (එ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | උකුවෙල, විල්ගමුව හා රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවත්වා නොතිබුණි. |
| (ඒ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | යටවත්ත, විල්ගමුව හා රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (ඔ) | නිවාඩු පිළිබඳ ලේඛනය | ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 1.7 වගන්තිය | උකුවෙල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඕ) | චෙක්පත් භාරදීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 388 හා 389 | යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |

**2.17 අනුකූල නොවීම්**

**2.17.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මුදල් රෙගුලාසි 11 , 12 | 200,944 | අවස්ථා 13 කදී යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පුනරාවර්තන වියදම් දැරීම සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන යොදාගෙන තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 388 හා 389 | 21,184,756 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක අවස්ථා 127 කදී චෙක්පත් භාර දීමේ ලේඛනයේ ආදායකයා හෝ චෙක්පත් නිකුත් කරන නිලධාරියා විසින් අත්සන් කිරීමකින් තොරව චෙක්පත් නිකුත් කර තිබුණි. |
| (ආ) | ජාතික අයවැය චක්‍රලේඛ | | |
| | 2016 ජනවාරි 06 දිනැති අංක බීපි/ජීපිඑස්/130 /9/14/එම්සි-iii දරන චක්‍රලේඛය | 687,420 | i. උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නොවන රාජකාරි සඳහා මුදාහල නිලධාරීන් 06 දෙනෙකු සඳහා 2014 වර්ෂයේදී ලබාදී තිබූ යතුරු පැදි වෙනුවෙන් අයකර ගත යුතු මුදල් අයකර නොතිබුණි. |
| | | 277,000 | ii. දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නොවන රාජකාරි සඳහා මුදාහල නිලධාරීන්ගෙන් අයකරගත් යතුරු පැදි වෙළඳපල වටිනාකම අයවැය දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) මාතලේ - දිස්ත්‍රික් ලේකම්ගේ චක්‍රලේඛය
--------------------------------

2017 අප්‍රේල් 01 දිනැති අංක දිලේ/05 /04/RIDP/2017 චක්‍රලේඛයේ 08 හා 04 ඡේද

(i) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කර තිබූ සත්ත්ව පාලන ව්‍යාපෘතියක් චක්‍රලේඛ උපදෙස් පරිදි සෞඛ්‍ය ආරක්ෂිතව ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ ග්‍රාම නිලධාරි වසම් 02 ක ආධාර ලැබීමට නුසුදුසු පුද්ගලයින් 03 දෙනෙකු සඳහා ආධාර ලබා දී තිබුණි.

**2.18 මානව සම්පත් කළමනාකරණය**
**----------------------------------**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**
**-----------------------------------------------------------------------------------**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැයකාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 521.27ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.322,967 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | සේවකතථ්‍ය සංඛ්‍යාව | සේවකපුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 58 | 46 | 12 |
| (ii) | තෘතියික මට්ටම | 41 | 25 | 16 |
| (iii) | ද්විතියික මට්ටම | 1,642 | 1,432 | 210 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 134 | 111 | 23 |
| | එකතුව | 1,875 | 1,614 | 261 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 261 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

**2.19 රජයේ නිලධාරින්ගේ ඇප තැබීම.**

---

අංක ඊ 92/ඇප හා 1993 ඔක්තෝබර් 07 දිනැති සියලුම ප්‍රාදේශීය ලේකම්වරු ඇමතූ ලිපිය ප්‍රකාරව විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්, ගණකාධිකාරි, පරිපාලන නිලධාරි, ප්‍රධාන කළමනාකරණ සහකාර, රියදුරු, ගබඩා භාරකරු හා අංශ ප්‍රධානී (සංවර්ධන) යන තනතුරු 07 කට අයත් ඇප තැබිය යුතු නිලධාරීන් 08 දෙනෙකු විසින් තැබිය යුතු මුදලට වඩා රු.75,000 ක් අඩුවෙන් ඇප තබා තිබුණි.

**2.20 තිරසාර සංවර්ධනය**

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ක්‍රියාකාරී සැළැස්ම පිළියෙල කර තිබුණ ද එය පිළියෙල කිරීමේදී එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය අනුව යමින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක කරගෙන නොතිබුණි.